“කවරෙකු අල්ලාහ් හා පරමාන්ත දිනය විශ්වාස කරන්නේද, ඔහු යහපතම කතා කරත්වා! එසේ නැතහොත් නිහඬව සිටිත්වා

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “කවරෙකු අල්ලාහ් හා පරමාන්ත
දිනය විශ්වාස කරන්නේද, ඔහු යහපතම කතා කරත්වා! එසේ නැතහොත් නිහඬව සිටිත්වා. කවරෙකු අල්ලාහ් හා පරමාන්ත දිනය විශ්වාස කරන්නේද, ඔහු තම අසල්වැසියාට ගරු කරත්වා! කවරෙකු අල්ලාහ් හා පරමාන්ත දිනය විශ්වාස කරන්නේද. ඔහු තම ආගන්තුකයාට සත්කාර කරත්වා!”
[صحيح] [متفق عليه]

අල්ලාහ් හා තමන් නැවත හැරී යන, තම ක්රියාවට ප්රතිඵල පිරිනමන, අවසන් දිනය විශ්වාස කරන ගැත්තාට, මෙම කරුණු සිදු කිරීම සඳහා ඔහුගේ විශ්වාසය ඔහු ව පොළඹවන බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ. පළමුවැන්න: යහපත් ප්රකාශ: එනම් සුබ්හානල්ලා යැයි තස්බීහ් පවසමින් අල්ලාහ්ව සුවිශුද්ධ කිරීම, 'ලා ඉලාහ ඉල්ලල්ලාහු' යැයි තහ්ලීල් පවසමින් අල්ලාහ් ඒකීයත්වයට පත් කිරීම, යහපත විධානය කිරීම, අයහපතින් වැළැක්වීම සහ ජනයා අතර සමාදානය ඇති කිරීම යනාදිය තුළිනි. දෙවැන්න: අසල්වැසියාට ගරු කිරීම: එනම් ඔහු සමග ත්යාග ශීලීව කටයුතු කිරීමෙන් හා ඔහුට හිංසා නොකිරීමෙනි. තුන්වැන්න: ඔබව බලන්නට එන ආගන්තුකයාට සත්කාර කිරීම: එනම්, යහ වදනින් කතා කිරීම හා ආහාර සැපයිම හා වෙනත් ආගුන්තුක සත්කාර තුළිනි.

https://sunnah.global/hadeeth/si/show/5437